---

**නවගත්තේගම ප්‍රාදේශීය සභාව**

**පුත්තලම දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2013 මැයි 13 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2012 මැයි 08 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 නොවැම්බර් 07 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව, නවගත්තේගම ප්‍රාදේශීය සභාවේ, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර, 2012 දෙසැම්බර් 31 දිනට නවගත්තේගම ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 36,443 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.72,811ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,531,601ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් මූල්‍ය පාලන ඌනතා නිරීක්ෂණය විය.

(අ) 2012 දෙසැම්බර් 31 දිනට සභාව විසින් බාහිර පාර්ශවයන් වෙත ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.1,902,545ක් වූ අතර, එයින් අවුරුදු එකක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු.515,320ක් විය.

(ආ) 2012 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.799,431ක් විය.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට ආදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000' | රු. 000' | රු. 000' |
| (i) | බදු කුලී | 1,304 | 1,015 | 289 |
| (ii) | බලපත්‍ර ගාස්තු | 111 | 102 | 09 |

**2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

**2.3.3 බදු කුලී**

කිරිමැටියාව සමෘද්ධි සංගමයට ලබා දී ඇති සභාවට අයත් පැරණි පුස්තකාල ගොඩනැඟිල්ලෙහි හිඟ කුලිය රු.21,000ක මුදල අයකර ගැනීමට විගණිත අවස්ථාව දක්වා කටයුතු කර නොතිබුණි.

**2.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්**

සභාව සතු රු.332,500ක වටිනාකමකින් යුක්ත මිනි කුබෝටා ට්‍රැක්ටරය හා ට්‍රේලරය වර්ෂ ගණනාවක සිට නිෂ්ක්‍රීයව තිබුණි.

**2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

2012 වර්ෂයේ දී මගනැගුම ව්‍යාපෘති 13 ක් සඳහා රු.6,500,000 ක මුදලක් ප්‍රතිපාදනය කර තිබුණ ද රු.2,500,000 ක වටිනාකමට වූ ව්‍යාපෘති 5 ක පමණක් වැඩ නිමකර තිබුණි.

**2.6 අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

**3. පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) වත්කම් කළමනාකරණය

(ඇ) ආදායම් පරිපාලනය